# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,704—1947ක්වූ මැයි මස 16 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Galle No. 162.—දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1947ක්වූ ජූනි මස 25වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු දිස්ත්‍රික්කේ කඩවත්සතරේ ගාලු නගර සභාවට අයත් පෙම්පිගලවත්තේ පිහිටා තිබෙන බිම්කැබලි ඇත්.

මුල් පිඹුරේ අංක. P. P. A 850. ගම—පෙම්පිගලවත්ත.

| අංක. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | මුර ඉඩමේ තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කඩවිදියේ ගේට්ඩ් අංක. 3, වරිපනම් අංක. 56 දරන ඉඩම සහ එහි තුල පිහිටි ගෙය | ආණ්ඩුව .. | .. උළුසෙවිලිකරනලද හුනු බැම්මෙන් බැඳපු ගෙයක් ඇති ඉඩම | 0 | 0 | 2·22 | 5,010 |

මුල් පිඹුරේ අංක. P. P. A 1,016. ගම—පෙම්පිගලවත්ත.

| අංක. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | මුර ඉඩමේ තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඇලඅද්දරවත්ත නොහොත් පෙම්පිගලවත්ත, ගාලු-මාතර පාරේ වරිපනම් අංක. 54 කොටස | ආණ්ඩුව සහ ඩබ්ලිව්. ඩී. ඇස්. අබේගුණවර්ධන මහත්මයා, සීමාසහිත ගාලු-මාතර මෝටර් රිය සමාගම, ගාල්ල | අවුරුදු 35ක් මහ පොල්ගසක් සහ හුනු බැම්මෙන් බැඳපු කානුවක කොටසක් ඇති ඉඩම | 0 | 0 | 4·47 | 708 |
| 2 | ඇලඅද්දරවත්ත නොහොත් පෙම්පිගලවත්ත, ගාලු-මාතර පාරේ වරිපනම් අංක. 52 කොටස | ආණ්ඩුව සහ ඇම්. සී. ගොමිස් මහත්මයා, අංක. 52, පෙම්පිගලවත්ත, ගාල්ල | අවුරුදු 35ක් මහ පොල්ගස් 2ක් ඇති ඉඩම | 0 | 0 | 2·99 | 384 |
| 3 | එම .. | ආණ්ඩුව .. | මුඩුබිම — .. | 0 | 0 | 0·31 | 45 |

මෙම ඉඩම් ගැන වැඩිපුර කාරණා ගාල්ලේ දිසාපතිතුමාගෙන්ද, ඒමාගේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැක.

මේ 1947ක්වූ මැයි මස 8වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ජී. රණසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

203 පරිච්ඡේදයේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තක් වශයෙන් එනම්:—ආණ්ඩුවේ අගනස විද්‍යාලයක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලයපිට පලාත් පාලක විධායක මණ්ඩලයෙන් නියමකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

පිඹුරේ අංක. A. 1,128. ගම—ගිරගම.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | බන්ඩියේවත්ත .. | (1) උඩවැසූ ගබොලින්කල බන්ගලාවකින්ද, (2) උඩවැසූ ගබොලින්කල කුඩා ගෙයකින්ද, (3) උඩවැසූ ගබොලින්කල වැසිකිලියකින්ද, (4) යකඩ කඹුවලින් හා ගබොලින්කල වැසිකිලියකින්ද, (5) යකඩ කඹුවලින් හා ගබොලින්කල ගව මඩුවකින්ද, (6) යකඩ කඹුවලින් හා ගබොලින්කල නාන කාමරයකින්ද, (7) ගබොලින් සාදාලද ළිඳකින්ද යුත් වැම්ලි සහිත වත්ත | ගුණසේන වාසල ධම්මදාස ගුණවර්ධන, ගිරගම | 3 | 2 | 39·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1947ක්වූ ජූනි මස 2වෙනි දින පෙරවරු 10ගේ කාලයේදී මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිය මේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1947ක්වූ මැයි මස 8වෙනි දින මහනුවර කච්චේරියේදීය.

කන්දසියා මෙනනනාදන්,
ආණ්ඩුවේ ඒජන්ත මඟින.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— තලවාකැලේහි ප්‍රසිද්ධ මැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස ,, ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" 6වෙනි කාණ්ඩයේ සඳහන් වන පංගුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් නියෝගයක් ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,124. ගම—තලවාකැලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | වපසරිය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තලවාකැලේවත්ත.. | ස්ථිර මැසිකිලියක් ඇති ගත් වත්තෙහි වගානොකරනලද කොටස | සීමාසහිත තලවාකැලේ වතු සමාගම (ඒජන්තවරු: ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම, කොළඹ) | 0 0 0·62 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ ජූනි මස 17වෙනි දින පෙරවරු 10ට තලවාකැලේ පොලිස් ස්ටේෂමේහිදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ මැයි මස 2වෙනි දින<br>නුවරඑළියේ කච්චේරියේදීය.

ජේ. ඩබ්ලිව්. එච්. ඕ'රීගන්,<br>නුවරඑළියේ ආණ්ඩුවේ උප ඒජන්ත විසින.

---

203වෙනි පරිච්ඡේදයේ 5වෙනි කාණ්ඩයේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටියේ ආණ්ඩුවේ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන් වන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පණිස " 1876 ක් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ සඳහන් වන පංගුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියෝගයක් මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. P. P. A 1,018. ගම—දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ මටගෙදරබද්දේ (මුස්ලිම්) ගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | වපසරිය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොස්ගලවත්ත නොහොත් ගොඩවත්ත | අවුරුදු 40 වයසැති පොල්ගස් 9ක්ද, අවුරුදු 30–40 වයසැති කොස්ගසක්ද, අවුරුදු 25 වයසැති දෙල්ගස් 4ක්ද, අවුරුදු 15 වයසැති පුවක්ගස් 145ක්ද, අවුරුදු 25 වයසැති කිතුල්ගස් 5ක්ද, අවුරුදු 15 වයසැති දෙහිගස් 4ක්ද සහ ජම්බුගසක්ද තිබෙන වත්ත | වැලිගම වැලිපිටියේ පදිංචි ඒ. ඇල්. ඇම්. ඇම්. මොහොමඩ් | 0 1 39·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ ජූනි මස 20වෙනි දින පෙරවරු 10ගේ කණිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවම ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ මැයි මස 10වෙනි දින<br>මාතර කච්චේරියේදීය.

ඒ. ඇම්. ඇස්. පෙරේරා,<br>මාතර ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත විසින.

---

## දැන්වීමයි.

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි කසිකාගම්ල සහ මාතලේ වතුවලින් නිමකර්ම ලබාගත් ගොවීන්ගේ පදිංචිය පිණිස සෑදීමට තිබෙන කෙවල්වල මැඩව මිනා පලපුරුද්දක් ඇති වඩුරාලලා සහ මේසන්වරුන්ගේ නාම ලයිස්තුවක් පිළියෙලකිරීම සඳහා එහි මැඩකිරීමට කැමති වඩුරාලලාගේ සහ මේසන්වරුන්ගේ ඉල්ලුම් පත්‍ර මා විසින් භාරගනු ලැබේ.

මෙවිම මැඩකම්වලට නියමිත ගණන් මෙ. මැයි විස්තර මෙම කන්තෝරුවෙන් දැනගත හැකිවේ.

තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුවන්ට කඩනැතිව මැඩ ලබාදීමට සියලු උත්සාහ දරනු ලැබේ.

මැඩකිරීමට මින්පෝ දූසිත සඳහන් විතුමලය.

වැඩව තෝරාගනු ලැබූ වඩුරාලලා සහ මේසන්වරුන් වැඩව උවමනා ආවුද තම ඔවුන්ම සපයාගත යුතුයි.

තේරීමේදී ඉහත සඳහන් වතු ආසල පදිංචි ඉල්ලුම්කාරයන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඒ. ඒ. වෙල්ලප්පා,<br>මාතලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙනුවට.

වර්ෂ 1947ක්වූ මැයි මස 12වෙනි දින<br>මාතලේ කච්චේරියේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.